සැකසුම - R.I.T.N. රත්නායක
ර/ඇරැපොල ශ්‍රී මහින්ද ම.වි

## කාර්ය පත්‍රිකාව -1 වන සතිය

- **නිපුණතාව 1.0** - **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි**
- **නිපුණතා මට්ටම 1.1** - **රේඛා භාවිතයෙන් මානව සත්ත්ව රූප අඳිමු**
- **ක්‍රියාකාරකම** - **1.1.1 විවිධ ඉරියව් සහිත මානව රූප අඳිමු**
  **1.1.2 විවිධ සත්ව ඉරියව් රේඛා මාධ්‍යයෙන් අඳිමු**

## I කොටස

**අංක 01 සිට 05 දක්වා අසා ඇති ප්‍රශ්න වල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) මානව රූප හා සත්ත්ව රූප රේඛාවෙන් අධ්‍යයනය කිරීමට ඔබ ගන්නා පැන්සල් වර්ග අයත් කාණ්ඩය වනුයේ

(i) පැස්ටල්
(ii) පාට පැන්සල්
(iii) 2B, 4B, 6B
(iv) ප්ලැටිග්නම්
(v) දියසායම්

(02) අස්ථි සැකිල්ල හා මානව රුව පිළිබඳ ඉතා සාර්ථක හැදෑරීම්වල නිරත වූ ඔබ දන්නා පුනරුද යුගයේ සිටි ශිල්පියෙකු වන්නේ

(i) පැබ්ලෝ පිකාසෝ
(ii) ලියනාඩෝ ඩාවින්චි
(iii) හෙන්රි මුවර්
(iv) ජෝර්ජ් බ්‍රාක්
(v) තිස්ස රණසිංහ

(03) මානව රූප ඇඳීමේදී එහි ප්‍රමිතිගත මිනුමක් පවතී. ඒ අනුව වැඩුණු මිනිසකු ඇඳීමේදී සාමාන්‍යයෙන් මුහුණ මෙන් ශරීරය කී ගුණයක් වේ ද?

(i) පස් ගුණයක්
(ii) දෙගුණයක්
(iii) හතර ගුණයක්
(iv) සය ගුණයක්
(v) හත් ගුණයක්

(04) මානව ඉරියව් කීපයක් සංරචනය කිරීමේදී වඩාත් වැදගත් වන්නේ

(i) ප්‍රකාශිත මානව රූප ස්වභාවික වීම
(ii) අර්ථ හා භාව නිරූපණය
(iii) තලය පිරී යන සේ රේඛාව යොදා ගැනීම
(iv) ස්වභාවිකත්වය නිරූපණය වන සේ රේඛාව හැසිරවීම
(v) ප්‍රාණ පූර්ණ රේඛාවෙන් දළ සටහන් ඇඳීම

(05) පහත සඳහන් අංග අතුරෙන් දෘෂ්‍ය කලා මූලිකාංගයක් නොවන්නේ

(i) රේඛාව (iv) අවකාශය

(ii) වර්ණය (v) රිද්මය

(iii) හැඩය

**අංක 06 සිට 10 දක්වා අසා ඇති ප්‍රශ්න ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(06) මානව හා සත්ත්ව රූප ඉරියව් අධ්‍යයනයේදී ක්ෂණිකත්වය, වේගය, චලනය පෙන්වීමට .................................................................. චිත්‍රයක අත්‍යවශ්‍ය අංගයකි.

(07) රේඛාව මගින් වස්තුවක ත්‍රිමාණත්වය මෙන්ම .................................................................. ද දැක්විය හැකිය.

(08) ඝන රේඛා, සියුම් රේඛා වැනි රේඛාවේ විවිධ ශක්තියෙන් සුදුසු පරිදි භාවිතයෙන් රූපවල හැඩ හා .................................................................. ලක්ෂණ මතු කළ හැකිය.

(09) චිත්‍රයක නිමාකරණය හා .................................................................. දැක්වීමට රේඛාව යොදා ගැනේ.

(10) මානව හා සත්ත්ව රූප අධ්‍යයනයේ දී දළ සටහන් ඇඳීමේදී .................................................................. හැඩතල ද උපයෝගී කර ගනී.

## ඇගයීම හා රසාස්වාදය

(11) ඔබ දන්නා මානව ඉරියව් කීපයක දළ සටහන් අඳින්න.

(12) ඔබ දන්නා සත්ත්ව රූප කීපයක් විවිධ ඉරියව් සහිත දළ සටහන් මගින් ඇඳ දක්වන්න.

(13) විවිධ වයස් කාණ්ඩ වලට අයත් මානව රූප අධ්‍යයනය කරන්න. එහිදී මානව රූපවල රිද්මය, පරිමාව, පරිමාණය, සමබරතාව, ගති ස්වභාවය මතුකර දක්වන්න.